# සී/ස ලංකා නැව් සංස්ථාව
## (වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය)

# ඇබෑර්තුව

පහත සඳහන් තනතුර සඳහා අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති සුදුසු අයදුම්කරුවකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1) නියෝජ්‍ය කළමනාකරු තනතුර (ලොජිස්ටික්)– MM 1-1, II ශ්‍රේණිය (ඇබෑර්තු 01)

**<u>සුදුසුකම්</u> :**

**බාහිර අපේක්ෂකයින් සඳහා:**

**1.** <u>අධ්‍යාපන සුදුසුකම්</u>

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද් යාලයක ව්‍යාපාර කළමනාකරණය/ විද්‍යා / වාණිජ / අලෙවිකරණය හෝ මානව සම්පත් පිළිබඳ උපාධිය

2. <u>වෘත්තීය සුදුසුකම්</u>

එක්සත් රාජධානියේ නැව් තැරැව්කරුවන්ගේ වරලත් ආයතනයේ සාමාජිකත්වය වාණිජ අංශවල සේවය කිරීම සඳහා අවශ්‍ය වේ.

**සහ**

ඉහත සුදුසුකම් ලබාගැනීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රය තුළ රජයේ දෙපාර්තුමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක කළමනාකරණ තනතුරක (MM කාණ්ඩය) අවම වශයෙන් එක් (01) වසරක සතුටුදායක සේවය.

**අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා :**

1. ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම්

**හෝ**

2. ක්ෂේත්‍රයට අදාලව කණිෂ්ඨ කළමනාකරු (JM 1-2) කාණ්ඩයේ හෝ ඊට ඉහල තනතුරක අවම වශයෙන් පස් (05) වසරක සතුටුදායක සේවය

**වැටුප් පරිමාණය :**

MM 1-1 – 2016 : රු. (53,175 -10 ×1375 -15× 1,910-95,575) සංශෝධිත වැටුප අනුව, 2020/01/01 දිනට MM 1-1 කාණ්ඩයේ II ශ්‍රේණියේ මූලික වැටුප රු. 53,175/- ක් වේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

**වයස් සීමාව:** වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** පත්කිරීමේ බලධාරියා විසින් පත්කළ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන තරඟකාරි ලිඛිත විභාගය සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

**පරිවාස කාලය :** අවුරුදු 03 කි.

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ. / සේ.නි.භා.අරමුදලට සංස්ථාවේ දායකත්වය
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් සඳහා රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිතා නොකල වෛද්‍ය නිවාඩු වලට ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා අදාල පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ සේවක මණ්ඩල ණය
7. සහනශීලී අනුපාත මත වාහන ණය

<u>**සෑම අයදුම්කරුවෙකුම**</u>

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
- ඕනෑම අංශයක සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය

## <u>අයදුම් කරන ආකාරය</u>

- සියලුම අයදුම්පත් තමා විසින් සත්‍ය බවට සහතික කළ අධ්‍යාපන / වෘත්තීය සහතිකපත්වල පිටපත් සමඟ උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපෑලෙන් ඔක්තෝම්බර් මස 01 දින හෝ ඊට පෙර සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව, අංක 27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** වෙත ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.

- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.

- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

---


**සභාපති**

**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**

**අංක 27, MICH ගොඩනැගිල්ල**

**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**

**කොළඹ 01**


2020.09.18